<u>මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය</u>
<u>19 වන කණ්ඩායම</u>
<u>දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය</u>

## විෂය තෝරා ගැනීමේ ක්‍රම රටාව

**ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ ප්‍රධාන විෂයයන් පහත දැක්වේ.**

1. පුරා විද්‍යාව
2. බෞද්ධ අධ්‍යයන
3. ආර්ථික විද්‍යාව
4. සමාජ විද්‍යාව
5. භූගෝල විද්‍යාව
6. තොරතුරු සංනිවේදන තාක්‍ෂණය (ICT)
7. ඉතිහාසය
8. පාලි *
9. දේශපාලන විද්‍යාව
10. සිංහල
11. සමාජ සංඛ්‍යානය

## ප්‍රධාන විෂයයන් තෝරාගැනිම - විෂය කාණ්ඩ

| පළමු කාණ්ඩය | දෙවන කාණ්ඩය | තෙවැනි කාණ්ඩය |
|---|---|---|
| සිංහල | සමාජ සංඛ්‍යානය | සමාජ සංඛ්‍යානය |
| සමාජ විද්‍යාව | ආර්ථික විද්‍යාව | පාලි * |
| දේශපාලන විද්‍යාව | භූගෝල විද්‍යාව | බෞද්ධ අධ්‍යයන |
| ඉතිහාසය | පුරා විද්‍යාව | පුරා විද්‍යාව |
| | පාලි * | ආර්ථික විද්‍යාව |
| | තොරතුරු සංනිවේදන තාක්‍ෂණය (ICT) | |

- ඉහත සඳහන් වගුවෙහි දැක්වෙන පරිදි පළමු කාණ්ඩයෙන් එක් විෂයයක් පමණක් ද, දෙවැනි සහ තෙවැනි කාණ්ඩවලින් එක් විෂයයක් බැගින් හෝ විෂයයන් දෙකක් බැගින් ද නියෝජනය වන පරිදි විෂයන් තුනක් තෝරා ගත හැකිය.

- පළමු කාණ්ඩය හැර දෙවැනි හා තෙවැනි කාණ්ඩ දෙකෙන් අඩුම වශයෙන් එක් විෂයක්වත් නියෝජනය වන පරිදි ද විෂයයන් තුනක් තෝරා ගත හැකිය.

- තවද, පළමු කාණ්ඩයෙන් එක් විෂයයක් පමණක් ද, දෙවැනි කාණ්ඩයෙන් විෂයයන් දෙකක් **හෝ** තෙවැනි කාණ්ඩයෙන් විෂයයන් දෙකක් නියෝජනය වන පරිදි විෂයන් තුනක් තෝරා ගත හැකිය.

සැ.යු - විෂයයන් තෝරා ගැනීමේදී ප්‍රථමයෙන් විෂය කාණ්ඩ වගුවේ ආකාරයට විෂයයන් තෝරාගැනීම කළ යුතුය.

පසුව එම තෝරාගත් විෂයයන් හැර අනෙකුත් විෂයයන් ඔබගේ මනාපය මත පෙලගස්වා ලබාදිය යුතුය.

විෂයයන් සඳහා ලියාපදිංචි කිරීමේදී ප්‍රථමයෙන් විෂය කාණ්ඩ වගුවේ ආකාරයට ඔබගේ විෂයයන් තෝරාගැනීමට මූලිකත්වය ලබාදෙන අතර යම්කිසි විෂයයක් සඳහා ඉල්ලුම් කල සිසුන් සංඛ්‍යාව සීමාව ඉක්මවා යන අවස්ථාවකදී,

- ඔබට යම්කිසි විෂයයක් ලබාදිය නොහැකි නම්, පසුව ඔබ සඳහන් කරන විෂයයන් අනුපිළිවෙලට අවස්ථාව සලකා බලා විෂය කාණ්ඩ වලට අනුකූලව ඔබට එම විෂයයන් තෝරාදෙනු ලැබේ. එහිදීද විෂයයන් ලබාදීම සඳහා අදාල නිර්ණායකයන් සලකා බලනු ලැබේ.

උදාහරණ : ඔබ පහත ලෙස විෂය කාණ්ඩ වලට අනුකූලව විෂයයන් තෝරාගනු ලැබුවේ නම්

| පළමු කාණ්ඩය | දෙවන කාණ්ඩය | තෙවැනි කාණ්ඩය |
|---|---|---|
| සිංහල | සමාජ සංඛ්‍යානය | ආර්ථික විද්‍යාව |

පසුව විෂය ප්‍රමුඛතාව පහත ලෙස දක්වන්න.

| | | | |
|---|---|---|---|
| 4 | සමාජ විද්‍යාව | 7 | දේශපාලන විද්‍යාව |
| 5 | භූගෝල විද්‍යාව | 8 | තොරතුරු සංනිවේදන තාක්ෂණය(ICT) |
| 6 | ඉතිහාසය | 9 | පුරා විද්‍යාව |

සෑම ස්ථලයකදීම (1000, 2000, 3000 ස්ථල) එනම් අධ්‍යයන වර්ෂ තුනේදීම පළමු ස්ථලයෙහිදී තෝරාගත් විෂය තුනම අඛණ්ඩව තෝරා ගැනීම සිදු කල යුතුය.

### ප්‍රධාන විෂයයන් සඳහා ලියාපදිංචි වීම

- ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා සඳහා අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරන ප්‍රධාන විෂයයන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට හදාරා තිබීම (පාලි විෂය හැර) පූර්ව අවශ්‍යතාවක් නොවේ.

- එහෙත් පූර්ව අවශ්‍යතා අපේක්ෂිත පාඨමාලා ඒකක තෝරා ගැනීමේ දී ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස විද්‍යාර්ථීන්ට උපදෙස් දෙනු ලැබේ. ප්‍රධාන විෂයවලට අදාළ හර පාඨමාලාවලට <u>අතිරේකව</u> <u>පදනම් පාඨමාලා</u> ඒකක ද හැදෑරීමට නිර්දේශ කරනු ලැබේ.

* පාලි විෂය හැදෑරීමට බලාපොරොත්තු වන ශිෂ්‍ය විද්‍යාර්ථීන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සඳහා පාලි විෂය හැදෑරිය යුතු අතර ධර්මාචාර්ය විභාගය සඳහා හෝ දහම් පාසල් අවසාන විභාගය සඳහා පාලි විෂය හදාරා තිබීම සලකා බලනු ලැබේ.